# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/ Vacancies - Reply (Vol – II) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.10.10 |
|---|---|---|---|---|---|

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනය

**<u>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ</u>**

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා සුදුසු නිලධාරීන් පත් කරලීම</u>**

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු වල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පවතී.

| අනු අංකය | තනතුර | ලිපිනය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, නො.135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07. | ශ්‍රී ලංකා පරිපාලන සේවය විශේෂ ශ්‍රේණිය |
| 02. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නො.135, සර් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07. | ශ්‍රී ලංකා පරිපාලන සේවය විශේෂ ශ්‍රේණිය |
| 03. | අධ්‍යක්ෂ | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහළ, සෙත්සිරිපාය, බත්තරමුල්ල. | ශ්‍රී ලංකා පරිපාලන සේවය I ශ්‍රේණිය |

02. ඉහත තනතුරු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර පදනමින් පත්කර ගැනීමට අවශ්‍යව ඇති බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MBRCA/01/10/02/08-9(iii) හා 2023.07.17 දිනැති, CA/1/1/27/6/1(ii) හා 2023.07.11 දිනැති සහ NH/AD/ARC/78 හා 2023.09.06 දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

අ.පි.බ


| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |
|---|---|---|---|---|---|---|---|

03. ඒ අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින උක්ත සඳහන් ආයතනයන්හි පුරප්පාඩුව පවතින තනතුරු සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ නිලධාරීන් වේ නම්, **2023.10.27** දිනට පෙර ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක්, ජීව දත්ත සටහනක් සමඟ තම ආයතන ප්‍රධානියා මඟින්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.


පී.ඩබ්ලිව්. රාජපක්ෂ

අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන : 0112-698605 / ෆැක්ස් : 0112 - 683651

විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com